ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකාවේ ධීවර සංගම් නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක්

ශ්‍රී ලංකා රජයේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ විවිධ ධීවර සංගම් නියෝජනය කරන නිලධාරීන් 20 දනෙක්ගෙන් සමන්විත කණ්ඩායමක් 2026 සැප්තැම්බර් 15 – 22 දක්වා මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ පූනේ හි සමූපකාර කළමනාකරණය පිළිබඳ වෙකුන්ත් මහේතා ජාතික ආයතනයේ පැවති ධාරිතා ගොඩනැගීමේ සහ දැනුම බෙදා හදා ගැනීමේ වැඩසටහනකට සහභාගී වූහ.

2. ශ්‍රී ලංකාවේ ධීවර සමූපකාර සමිතිවල ආයතනික, කළමනාකාර සහ ව්‍යවසායකත්ව ධාරිතාවය ශක්තිමත් කිරීම මෙම වැඩසටහනහේ අරමුණ විය. ශක්‍ය, වාණිජමය නැඹුරුවක් සහිත, තිරසාර සමූපකාර ආයතන ගොඩනැගීම සඳහා ඉවහල් වීම ද මහේ අපේක්ෂාවක් විය.

3. සමූපකාර පාලනය සහ කළමනාකරණය; ධීවර සමූපකාර සමිති පිහිටුවීම සහ ශක්තිමත් කිරීම; සමූපකාර ව්‍යාපාරික ආකෘතීන් සහ ජීවනෝපාය සංවර්ධනය; ධීවර කළමනාකරණය සහ තිරසාර ජලජීවී වගාව; ධීවර ක්ෂේත්‍රයේ අගය දාම; අස්වැන්නතේ පසු කටයුතු කරන ආකාරය සහ අගය එකතු කිරීම; තත්ත්ව පාලනය සහ ක්‍රියාවලීන් සඳහා යොදු ගන්නා භාවිතයන්; සමූපකාර නිෂ්පාදිතයන් අලවේකරණය සහ සන්නාමකරණය; ව්‍යවසායකත්වය සහ මූල්‍ය කළමනාකරණය; නායකත්ව සහ ආයතනික සංවර්ධනය; සහ සාර්ථක ඉන්දිය සමූපකාර ආයතනවල මනා භාවිතයන් බෙදා හදා ගැනීම යනාදිය සම්බන්ධයතේ තාක්ෂණික සහ ප්‍රායෝගික සැසි රැසක් මෙම වැඩසටහනට ඇතුළත් විය.

4. ශ්‍රී ලංකා කණ්ඩායම සමූපකාර ආකෘතිය පදනම් කරගත් ව්‍යාපාරික මහෙයුම්, අගය එකතු කිරීම, තාක්ෂණය භාවිතා කිරීම සහ වළෙඳෙපොළ සබඳතා සම්බන්ධයතේ ප්‍රායෝගික දැනුම සහ අවබෝධය ලබා ගැනීම සඳහා ධීවර, කිරි නිෂ්පාදන, කෘෂිකාර්මික සහ කෘෂි ක්‍රියාවලීන්හි නිරත සමූපකාර ආයතන වතෙ ද සංචාරය කළහ.

5. මමෙ වැඩසටහන ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර දැනට ක්‍රියාත්මක ධාරිතා සංවර්ධන සහයෝගිතාවය යටතේ සංවිධානය කර තිබිණ. ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 2025 ශ්‍රී ලංකා සංචාරය අතරතුර වාර්ෂිකව ශ්‍රී

ලාංකේය වෘත්තිකයන් 700 දනෙක්ුට විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් ලබා දනෙ ඔවට සිදු කල නිවේදනයෙන් අනතුරුව මමෙ හවුල්කාරිත්වය තවදුරටත් ශක්තිමත් විය. ඉන්දියාවේ යහපාලනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානය (NCGG) සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම යටතේ ද වාර්ෂිකව ශ්‍රී ලංකා රජයේ සේවකයන් 300 දනෙක්ුට පුහුණු අවස්ථා හිමි වන අතර ඒ අනුව ඉන්දියාවේ ධාරිතා සංවර්ධන මුලපිරීම යටතේ දැන් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1,000කට ප්‍රතිලාභ සැලසේ.

****

කොළඹ
2026 සැප්තැම්බර් ***22***